# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**සබරගමුව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ**

## පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01. | සබරගමුව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ | පශු වෛද්‍ය විද්‍යා උපාධියක් සහිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර 3ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම. | 01 | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සබරගමුව පළාත. |
| සටහන :- අයදුම්පත් භාරගන්නා අවසාන දිනය (2025.06.16) වන විට මෙම තනතුරට බඳවා ගැනීමට අදාළ සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කෙරන සියලුම සහතිකපත්වල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවීම අනිවාර්ය වේ. | | | | |

**01. මූලික සුදුසුකම් :-**

1) අවම වශයෙන් ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර 3ක සක්‍රීය හා සතුටුදායක සේවාකාලයක් තිබීම.
2) අයදුම්පත් කැඳවන අවසන් දිනට වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
4) සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම.

**02. වැටුප් පරිමාණය :-**

මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රා.ප.ච. 10/2025හි SL 1 - 2025 - රු 82,150 - 10x2400 - 8x2940 - 17x3900 – 195,970/= වේ. එම වැටුප් පරිමාණයෙහි 20 වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ.

**03. වයස් සීමාව :-**

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් වෙතින් පමණක් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවා ඇති බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

**04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-**

මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එහි දී ජ්‍යෙෂ්ඨතාවය, කුසලතාවය හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඉටුකර ඇති සුවිශේෂී දායකත්වය ද, කළමනාකරණ හැකියාව ද, සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීමේ හැකියාව ද සැළකිල්ලට ගෙන ලකුණු ලබා දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ඉහලම ලකුණු ලබා ගන්නා අයදුම්කරු තනතුර සඳහා පත්කර ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.

ජ්‍යෙෂ්ඨතාවය - ලකුණු 50
කුසලතාවය - ලකුණු 50

**05.** සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2025.06.16 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතු ය.) **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"සබරගමුව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් භාර ගනු නොලැබේ.

**06.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය ද, මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ද සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

**07.** මෙම දැන්වීමේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුවේ.

මෙයට,
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.
2025.05.23.

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.